**සවුදි අරමුදලින් මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2013**

---

සවුදි අරමුදලින් මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2013 ජූනි 03 සිට දෙසැම්බර් 31 දිනෙන් අවසන් පලමු ගිණුම් කාල පර්ච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර.) සහ සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල (සං.ස.අ.) අතර 2012 ඔක්තෝබර් 30 දින එළඹි අංක 9/574 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුමට අනුව මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ) මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර සහ උතුරු පලාත් වල මාර්ග කොටස් නවයක කිලෝමීටර 138.39 ක මුළු දුර ප්‍රමාණයක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 10,628 ක් වූ අතර මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ණයදෙන ආයතනය | එකඟ වූ වටිනාකම | | අයවැය ගත මුළු පිරිවැයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | *එ.ජ.ඩො. (මිලියන)* | *රු.(මිලියන)* | |
| සං.ස.අ. | 60 | 7,800.00 | 73 |
| ශ්‍රී.ලං.ර | - | 2,828.41 | 27 |
| | ---- | --------- | |
| එකතුව | 60 | 10,628.41 | |

ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු 2013 ජූනි 03 වන දින ආරම්භකර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට පෙර නිමකිරීමට සැලසුම්කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු

පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ජේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින්

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) පෙර වර්ෂයේ මාගේ විගණන වාර්තාවේ පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් පියවර ගෙන ඇති බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**4.1 මූල්‍ය කාර්යසාධනය**

----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2013 ජූනි 03 සිට දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු. මිලියන 1,247 ක් වූ අතර එහි සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් වර්ගය | 2013 ජූනි 03 සිට දෙසැම්බර් 31 දිනෙන් අවසන් පලමු ගිණුම් කාල පර්ච්ඡේදය සඳහා වියදම |
|---|---|
| | රු. |
| කෙරීගෙන යන වැඩ | 509,999,448 |
| ලැබිය යුතු ගිණුම් | 89,431 |
| | 510,088,879 |

**5. විගණන නිරීක්ෂණ**

---------------------

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

අ) ණය ලබා දෙන ඒජන්සිය විසින් සිදුකළ ඍජු වියදම් ගිණුම් ගත නොකිරිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණය ලැබීම් රු. 417,365,257 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද ඉහත සාවද්‍යතාව හේතුවෙන් වටිනාකම රු. 6,956,719 ක විදේශ විනිමය පාඩුවද ගිණුම් ගත කර නොතිබුණි.

ආ) වෙනත් ව්‍යාපෘතියකින් මෙම ව්‍යාපෘතියට මාරු කළ රු. 796,700 ක් වටිනා පරිගණකයක් හා උපාංග මාර්ග සංවර්ධන අධිකාරිය වෙත බාර දී තිබුණි. කෙසේ වෙතත් අදාල වත්කමේ භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමට භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-------------------------------------

### 6.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| | ණය ගිවිසුම අනුව ලබාදීමට එකඟ වූ වටිනාකම | | 2013 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදන | 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. (මිලියන) | රු.(මිලියන) | රු.(මිලියන) | රු. (මිලියන) | % |
| සං.ස.අ. | 60 | 7,800** | 386.673 | 386.673 | 4.96 |
| ශ්‍රී.ලං.ර | - | 2,828 | 88.373 | 39.343 | 1.39 |
| | ---- | ---------------- | ---------------- | --------------- | |
| | 60 | 10,628 | 475.046 | *426.016 | |

* උපචිත වියදම්, රඳවා ගත් මුදල් සහ තවදුරටත් අය කර ගැනීමට ඇති අන්තර් ජංගම ගිණුම් වල ගණුදෙණු ඇතුලත් නොකිරිම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දක්වා ඇති වටිනාකම් සමග මෙම වටිනාකම් වෙනස්ය.

** එකගවූ ණය වටිනාකම 2012 ඔක්තෝම්බර් 30 දින පැවති එ.ජ.ඩොලරයට රු.130 ක විනිමය අනුපාතය මත පරිවර්තනය කර ඇත.

### 6.2 භෞතික ප්‍රගතිය

-------------------

2012 ජනවාරි 12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි ගනු ලැබු තීරණය අනුව මෙම ව්‍යාපෘතිය යටතේ කිලෝමීටර 144 ක් පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වෙතත්, මාර්ග 09 ක කිලෝමීටර 138.39 ක් පුනරුත්ථාපනය කිරීමට පිරිවැය ඇස්තමේන්තු සකස් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී මාර්ග පහක කිලෝමීටර 57.68 ක් පුනරුත්ථාපනය කිරීමට ව්‍යාපෘතිය කොන්ත්‍රාත්තු පිරිනමා තිබු අතර 2013 දෙසැම්බර් 31 දිනට එම මාර්ග වල භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| මාර්ගයේ නම | දිග | නිම කිරීමට අපේක්ෂිත දිනය | 2013 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | (කි.මී.) | | ඉලක්කගත % | තථ්‍ය % |
| නුවර-යාපනය මාර්ගය (ඒ-09) කටුගස්තොට සිට අලවතුගොඩ දක්වා | 10.97 | 2014 ජූනි 02 | 46.63 | 11.23 |
| නුවර-යාපනය මාර්ගය (ඒ-09) අලවතුගොඩ සිට පලාපත්වල දක්වා | 16.97 | 2014 ජූනි 02 | 44.45 | 12.61 |
| තඹලගාමම්-කින්නියා මාර්ගය (බී 541) තඹලගාමම් සිට සූරන්ගෙ දක්වා | 8.50 | 2014 දෙසැම්බර් 06 | 16.70 | 6.96 |
| දෙහිඕවිට-දැරණියගල-නූරි මාර්ගය (බී093) දෙහිඕවිට සිට දැරණියගල දක්වා | 14.00 | 2014 දෙසැම්බර් 04 | 11.94 | 7.41 |
| කොළඹ-නුවර මාර්ගය (ඒ01) පැලියගොඩ-කිරිබත්ගොඩ දක්වා | 7.24 | 2013 දෙසැම්බර් 12 | 0.11 | 0.10 |

**6.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් කොන්දේසි අංක 103.4 හි ii වෙළුමෙහි විශේෂිත පිරිවිතර සඳහාවූ කොන්දේසිය ප්‍රකාරව, ඉදිකිරීම් කාලය තුළ මාර්ග ආරක්ෂණ පියවරයන් පවත්වාගෙනයාම කොන්ත්‍රාත්කරුගේ වගකීමකි. වැඩබිමේ රැස්වීම් වාර්තා අනුව, දෙහිඕවිට-දැරණියගල-නූරි මාර්ගයේ වාහන තදබදය කළමනාකරණය කිරීම සතුටුදායක නොවුණි. මාර්ගය භාවිතාකරන්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ සමඟ අනුගත වීමට ව්‍යාපෘතියේ නේවාසික ඉංජිනේරු විසින් කටයුතු කර නොතිබුණි, එසේම, ව්‍යාපෘතිය විසින් සංවර්ධනය කොට ඇති සෞඛ්‍ය, ආරක්ෂණ හා පාරිසරික කළමනාකරණ ප්‍රතිපත්ති වලට අනුව, අවට ඉඩම් හිමියන් හා මාර්ගය භාවිතා කරන්නන්ගේ අපහසුතා අවම කිරීමට අවශ්‍ය කටයුතු කොන්ත්‍රාත්කරු ඉටුකළ යුතුය. දෙහිඕවිට-දැරණියගල-නූරි මාර්ගයේ දූවිලි විමෝචන පාලනය සඳහා ඉටුකළ කටයුතු ප්‍රමාණවත් නොවන බව වැඩබිමේ රැස්වීම් වාර්තා මඟින් අනාවරණය විය.

(ආ) ප්‍රමාණ බිල්පත් අනුව ප්‍රතිපාදන නොතිබියදීත්, දෙහිඕවිට-දැරණියගල-නූරි මාර්ගයේ සීමා ලකුණු සැපයීම වෙනුවෙන් රු. 1,421,000 ක් ගෙවා තිබුණි.

**6.4 නිශ්ඵල ගනුදෙනු**

කොන්ත්‍රාත් කොන්දේසි 4.2 සහ 14.2 උප වගන්ති අනුව පැවරීමේ ලිපිය නිකුත් කර දින 42 ක් ඇතුළත හෝ ලියකියවිලි ලැබී දින 21 ඇතුලත යන දෙකෙන් පසුව එලඹෙන දිනයකට පෙර අත්තිකාරම් ගෙවීමේ පළමු වාරිකය කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුය. කෙසේවෙතත්, අත්තිකාරම් නිශ්චිත කාලයේදී නිදහස්කර නොතිබුණු අතර මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය නොමැතිව රු. 13,060,861 ක් පොලිය වශයෙන් ගෙවීමට ව්‍යාපෘතියට සිදු වී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| කොන්ත්‍රාත්තුව | පො.ගෙ.ස. අංක | ගෙවූ පොලිය |
|---|---|---|
| | | රු. |
| දෙහිඕවිට-දැරණියගල-නූරි මාර්ගය(කිලෝමීටර0+000 සිට14+000) | 03 | 2,642,452 |
| තඹලගාමම්-කින්නියා මාර්ගය (කිලෝමීටර 0+000 සිට 8+500) | 06 | 2,079,435 |
| නුවර-යාපනය මාර්ගය (කිලෝමීටර 4+600 සිට 15+570) | 02 | 3,929,788 |
| නුවර-යාපනය මාර්ගය (කිලෝමීටර 15+570 සිට 32+540) | 02 | 4,409,186 |
| | | 13,060,861 |

**6.5 මානව සම්පත් කළමනාකරණය**

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත නිලධාරින් 09 දෙනෙක්ද, ව්‍යාපෘති සම්බන්ධිකරණ ඒකකය වෙත නිලධාරින් 02 ක්ද බඳවා ගැනීම සඳහා 2007 අප්‍රේල් 05 දිනැති කලමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක ඩී.එම්.එස්. 33 ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.